# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,052 — 1934ක්වූ මැයි මස 25 වෙනි දිනවූ සිකුරාදා.

# Part IV. — හතරවෙනි කාණ්ඩය.

### උපාධිශ නීති.

"1920සේ අංක 1 දරන අධ්‍යාපන ආඥාපණත."

වර්ෂ 1934ක්වූ අප්‍රේල් මස 6වෙනි දින නො. 8,042 දරණ ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රයෙන් උපුටාගන්නාලදී.

මාතලේ ආදායම් දිස්ත්‍රික්කයේ අධ්‍යාපන දිස්ත්‍රික් කාර්‍ය්‍යසභාව විසින් "1920සේ අංක 1 දරන අධ්‍යාපන ආඥාපණතේ" 25වෙනි වගන්තිය යටතේ සම්පාදිතව අධ්‍යාපන සභාව විසින් මැනවැයි පිළිගන්නාලදින් ආණ්ඩුකාරයාණන්වහන්සේ විසින් එකී වගන්තියෙන් හා 1931සේ ලංකා (රාජ්‍යසභා) රාජසභාවේ නියෝගයේ 93වෙනි වගන්තියෙන් උන්වහන්සේට පැවරී තිබෙන බලය යටතේ ස්ථිරකරනලද උපනීති.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර,
අධ්‍යාපන අමාත්‍යතුමා.

1934 මාර්තු මස 21වෙනි
දින කොළඹදීය.

---

### උපනීති.

1927ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින නො. 7,608 දරණ ගැසට් පත්‍රයේ පළකරනලද 1927 සැප්තැම්බර් මස 29වෙනි දින දරන උපනීති මෙයින් අවලංගුකොට ඒ වෙනුවට පහත පෙනෙන උපනීති ඇතුළත්කරනු ලැබේ:—

1. වචනාර්ථ.—

"පිරිමි ළමයා," "ගැහැනු ළමයා," "ළමයා" යන මේ ව්‍යවහාරයන්ගෙන් මීට ඇතුළත් "A" උපලේඛනයෙහි විස්තරවන ප්‍රදේශයේ වසන පිරිමි ළමයෙක් හෝ ගැහැනු ළමයෙක් හෝ ළමයෙක් අදහස්කරනු ලැබේ.

"පැමිණීම" යනුවෙන් අදහස්කරනුලබන්නේ ව්‍යවස්ථා පොතේ නියමකොට තිබෙන පරිදි පැමිණීමේ ලේඛනයක සම්පූර්ණ පැමිණීමක් වශයෙන් ගැනෙන ව්‍යවස්ථා පොතේ විස්තරවන කාලයක් පැමිණීමයි.

"ව්‍යවස්ථා පොත" යනුවෙන් හඟවනු ලබන්නේ රාජ්‍ය මන්ත්‍රණසභාගත ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් අනුදන්නාලද එවකට පවතින ආධාර පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතයි.

"දිස්ත්‍රික් කාර්‍ය්‍යසභාව" යනුවෙන් අදහස්කරන්නේ මාතලේ ආදායම් දිස්ත්‍රික්කයේ අධ්‍යාපන දිස්ත්‍රික් කාර්‍ය්‍යසභාවයි.

"පාඨශාලාව" යනුවෙන් අදහස්කරන්නේ අධ්‍යාපනාධ්‍යක්ෂතුමා විසින් පිළිගන්නාලද යම්කිසි පාඨශාලවකි. මීට යාකරනලද "B" උපලේඛනයේ විස්තරවන පාඨශාලාද මීට ඇතුළත් වේ.

"ළමයෙකුට ඉගැන්වීම සඳහා සෑහෙන යෝග්‍යවූ විධිවිධාන" යන්න හා "නිදහසට කියහැකි සෑහෙන කරුණු" යන්නත් 1920සේ අංක 1 දරන අධ්‍යාපන ආඥාපණතේ 25වෙනි වගන්තියේ (2) වෙනි (3) වෙනි උපවගන්තිවලින් ඒට දී තිබෙන තේරුම්ම දරන්.

2. කාර්‍ය්‍යසභාව සාමාන්‍ය වශයෙන් දෙමසකට වරක් බැගින් කාර්‍ය්‍යසභාව විසින් නියමකරගනුලබන දිනවලදී මාතලේ කච්චේරියේදී රැස්විය යුතුය.

3. රැස්වීම්වල වාර්තා සටහන් පොතක ලියාතබා රැස්වීම අවසානවූ වහාම එබඳු සටහනේ පිටපත් සාමාජිකයන් අතර බෙදදිය යුතුය.

4 (*a*) මේ උපනීති සම්බන්ධව "A" උපලේඛනයේ විස්තර වන ප්‍රදේශය 1920සේ අංක 1 දරන ආඥාපණතේ 25 (*c*) වෙනි වගන්තියේ ප්‍රකාර සෑහෙන විධිවිධාන සලසා තිබෙන ප්‍රදේශයක්කොට ගැනේ.

(*b*) පාඨශාලාවට යායුතු ළමයි.—වයස අවුරුදු 6කට අඩු නුවූ හෝ 14කට වැඩිනුවූ සෑම පිරිමි ළමයාගේ පියා හෝ මව විසින්ද, වයස අවුරුදු 6කට අඩුනුවූ හෝ 12කට වැඩිනුවූ හෝ, මුස්ලිම් සහ දෙමළ ගැහැනුළමයින් නම්, වයස අවුරුදු 6කට අඩුනුවූ හෝ 10කට වැඩිනුවූ සෑම ගැහැනුළමයාගේ පියා හෝ මව විසින්ද එබඳු පිරිමි ළමයාට හෝ ගැහැනු ළමයාට පාඨශාලාවට පැමිණීමට සැලැස්විය යුතුය.
ඒ එසේ වුවත්—

(1) ඉගෙනීම සඳහා වෙන සෑහෙන යෝග්‍ය විධිවිධාන සලසා තිබෙන විට, හෝ

(2) නොපැමිණීම ගැන නිදහසට කියහැකි සෑහෙන කරුණක් තිබෙනවිට, හෝ

(3) ගැහැනුළමයින්වූවිටනම් පාඨශාලාවේ ගුරුපිරිසට ගැහැනු ගුරුවරියක් පත්කර නැතිවිට, හෝ

**No. 10,987, S. O.**—නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ තීරයන්වල ප්‍රකාරයට වර්ෂ 1934ක්වූ අගෝස්තු මස 7වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 9ට කුලියාපිටියේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අනුමතයකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දේවමැදිහත්පත්තුවේ අංගොමුකෝරළේ කොඨාසයේ පිහිටා තිබෙනබිම් කැබලි 10ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 2,426. ගම—වැටැහැපිටිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරයන්නා. | අන්දම. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 34 | ගලගාවවත්ත .. | වැටැහැපිටියේ පදිංචි (1) වීරසිංහමුදියන්සෙලාගේ පුංචප්පුහාමි, තමා වෙනුවට සහ (2) එමගම එමගේ මුදලිහාමි (3) එමගම එමගේ හේරත්හාමි, (4) එමගම එමගේ උක්කුමැනිකා වෙනුවටත් හිඟ මුදල් ගෙවා නැත | පොල්වත්ත .. | 0 | 3 | 31 |
| 38A | කෝන් ගහ මුල හේන නොහොත් කෝන් ගහමුලවත්ත | වැටැහැපිටියේ පදිංචි සුබසිංහමුදියන්සෙලාගේ හේරත්හාමි .. | එම .. | 1 | 0 | 0 |
| 38B | එම .. | වැලිවෙහෙර පදිංචි රන්මෙත්තදුරයලාගේ මැනිකී .. | එම .. | 0 | 2 | 4 |
| 38C | එම .. | වැලිවෙහෙර පදිංචි රන්මෙත්තදුරයලාගේ බිලිඳ .. | එම .. | 0 | 2 | 4 |
| 38D | එම .. | වැලිවෙහෙර පදිංචි රන්මෙත්තදුරයලාගේ ඕංගා .. | එම .. | 0 | 2 | 3 |
| 38F | එම .. | අඹුවේකර ලේකම්මහත්මයලාගේ සෙලෙසිමාන් ලෙබ්බේ වෙල් විදානේ | එම .. | 0 | 1 | 12 |
| 50 | දන්ගහමුලවත්ත .. | වැටැහැපිටියේ පදිංචි සුබසිංහමුදියන්සේලාගේ පින්හාමි විසින් හිඟ මුදල් ගෙවා නැත | එම .. | 1 | 3 | 20 |
| 52B | සියඹලාගහමුලහේන. | වැටැහැපිටියේ පදිංචි ජයසිංහආරච්චිල්ලාගේ පිංහාමි .. | හේන .. | 0 | 1 | 36 |
| 52D | එම .. | කිරිමැටියාවේ පදිංචි වීරසිංහමුදියන්සේලාගේ මෙනුඑතනා .. | එම .. | 0 | 1 | 38 |
| 13B | කහටගහමුලහේන .. | ආණ්ඩුව .. .. .. .. | එම .. | 3 | 1 | 33 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100ට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1934ක්වූ මැයි මස 21වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්යයක්හිදිකට, ඒනම්:—කොළඹ-ලබුගම හන්දිය අළුත්පාර වැඩිදියුණු කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියා කරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ තරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A. 257. ගම—බැද්දේගෙදරමුල්ල සහ වටරුක.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | දෙල්ගහවත්ත .. | එලවළු සිටවූ ඉඩම .. | එච්. දෙන් ජෝන් අප්පුහාමි, එච්. දෙන් සුවාරිස් අප්පුහාමි සහ එච්. දෙන් පිංරෝලිස් අප්පුහාමි, සියල්ලම බැද්දේගෙදරමුල්ල | 0 | 0 | 1·5 |
| 2 | එම .. | වත්ත (හිස්ඉඩම) .. | එම .. .. | 0 | 0 | 1·1 |
| 3 | කොලොන්කුඹුරේ ඔවිට | එලවළු සිටවූ ඔවිට .. | එච්. දෙන් ජෝන් අප්පුහාමි, බැද්දේගෙදර මුල්ල සහ එච්. ගිරීගෝරිස්, මීගොඩ | 0 | 0 | 0·4 |
| 4 | කොලොන්කුඹුර .. | පුවක්ගහකින් යුත් කුඹුර .. | එම .. .. | 0 | 0 | 8·3 |
| 5 | එම .. | කුඹුර .. .. | එම .. .. | 0 | 0 | 4 |
| 6 | කොලොන්කුඹුරේ ඔවිට | බුලත් සිටවූ ඔවිට .. | එම .. .. | 0 | 0 | 1·1 |
| 7 | කොලොන්කුඹුර .. | කුඹුර .. .. | එම .. .. | 0 | 0 | 4·3 |
| 8 | ගොඩකුඹුර .. | එම .. .. | වයි. ඒ. හෙන්ද්‍රික් පෙරේරා, වයි. ඒ. සිමන්පෙරේරා, වයි. ඒ. ජෙහානා පෙරේරා, ජී. සොපායා හාමිනේ සහ ඇගේ ළමයින් හයදෙනා, සියල්ලම බැද්දේගෙදරමුල්ල, වයි. ඒ. විලියම් පෙරේරා, වයි. ඒ. ජෙහානා පෙරේරා, සහ එච්. ගිරීගෝරිස්, සියල්ලම මීගොඩ, වයි. ඒ. පොඩිනෝනා පෙරේරා, හොරගල, පාදුක්ක සහ වයි. ඒ. බේබි පෙරේරා, හොරගල, පාදුක්ක | 0 | 0 | 2·5 |
| 9 | එම .. | එම .. .. | එම .. .. | 0 | 0 | 3·6 |
| 10 | ගොඩකුඹුරේඔවිට .. | අල සිටවූ ඔවිට .. | එම .. .. | 0 | 0 | 2 |
| 11 | එම .. | කොසෙල් පඳුරු 8කින් යුත් ඔවිට .. | එම .. .. | 0 | 0 | 2·5 |
| 12 | ගොඩකුඹුර .. | උනගස් 7කින් යුත් කුඹුර .. | එම .. .. | 0 | 0 | 3·5 |
| 13 | එම .. | කුඹුර .. .. | එම .. .. | 0 | 0 | 3·7 |

සිතියමේ නො. A. 258. ගම—පනාගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | මුදක්කුවෙවත්ත .. | පොල්ගස් 2කින් යුත් ඉඩම .. | ඩබ්ලිව්. ජේම්ස්අප්පු, පනාගොඩ .. | 0 | 0 | 5·6 |
| 2 | එම .. | කොස්ගස් 2ක් සහ බුලත්වැල් 5කින් යුත් ඉඩම | ඩබ්ලිව්. ජේකන් පෙරේරා, පනාගොඩ .. | 0 | 0 | 3·8 |
| 3 | එම .. | පොල්ගසකින් යුත් පොල්ඉඩම .. | ජේ. ආර්. මාටන්ස්ටයින්, නො. 191, හැව්ලොක්ටවුන්, කොළඹ | 0 | 0 | 3·3 |
| 4 | එම .. | රබර්ගස් 2කින් යුත් රබර්ඉඩම .. | එම .. .. | 0 | 0 | 15·6 |

සිතියමේ නො. A. 259. ගම—ගැහැනුවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයන්නා. | අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | ආඩියාමඩමෙලඅ .. | පොල්ගසකින් යුත් පොල්ඉඩම .. | එච්. සයිමන්අප්පු, ගැහැනුවල .. | 0 | 0 | 0·5 |
| 2 | එම .. | පොල්ගස් 2ක් සහ දෙල්ගසකින් යුත් ඉඩම | ඒ. බත්තොහාමි සහ එච්. සයිමන්අප්පු, ගැහැනුවල (ආරවුල්පිට) | 0 | 0 | 3·3 |
| 3 | එම .. | පොල්ගසකින් යුත් පොල්ඉඩම .. | එම .. .. | 0 | 0 | 0·5 |
| 4 | එම .. | පොල්ගස් 3ක්ද, කොස්ගසක් සහ පුවක්ගස් 5කින් යුත් ඉඩම | එච්. සයිමන්අප්පු, ගැහැනුවල .. | 0 | 0 | 6·6 |
| 5 | එම .. | පොල්ගස් 3ක්ද, පුවක්ගස් 4ක්ද, අඹගසක්ද, ගොඩපොරගසක්ද, උනපඳුරක් සහ කානුවක කොටසකින් යුත් ඉඩම | ඒ. බත්තොහාමි, ගැහැනුවල .. | 0 | 0 | 6·9 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 6 | සිරිමැදුරවතත නොහොත් ආඩියම්බමෙලදෙ | මුඩුබිම .. .. | ඩාර්ලි බට්ලර් කොම්පැනිය (සුපරින් මැන්ඩන්ට් ආර්. බී. කාටර් මහත්මයා, පාදුක්ක) | 0 0 0·5 |
| 7 | ආඩියාම්බමෙලදෙ .. | රබර්ගස් 2කින් සහ කානු‍ෙක කොටසකින් යුත් ඉඩම | ඒ. බත්තොහාමි, ගැහැනුවල .. | 0 0 3·6 |

සිතියමේ නො. A. 260. ගම—වවරක.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පින්නලදෙ .. | රබර්ගස් 22ක් සහ පුවක්ගස් 3කින් යුත් රබර්ඉඩම | එච්. විජේවර්දනනෝනා නො. 249, ගාලු පාර, කොල්ලුපිටිය | 0 1 6·5 |
| 2 | එම .. | රබර්ගස් 17කින්යුත් රබර්ඉඩම .. | එම .. .. | 0 1 10·2 |

සිතියමේ නො. A. 261. ගම—ගංවැල්ල ඉහල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කනකෙතතවතත හොහො ත්රුක්අනනගහවතත | කෙහෙල්ගසකින්යුත් ඉඩම .. | ජේ. බාබින්අප්පු, ගංවැල්ල ඉහල .. | 0 0 0·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ ජූලි මස 13වෙනි දින පෙරවරු 9·30ට කනිසමට පාදුක්කේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මැයි මස 21වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඩබ්ලිව්. එච්. මුර්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ සවයුත්තකට, එනම්:—බොරලැස්ගමුව පාරේ උඩහමුල්ල කොරවල ගේල් ගේට්ටුව අසල පාර පළල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A. 335. ගම—උඩහමුල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කහටනනවත්ත .. | වත්ත (හිස්ඉඩම) .. .. | ජී. බී. ගැගරි, උඩහමුල්ල .. | 0 0 0·8 |
| 2 | එම .. | පොල්ගස් 5ක්ද, පුවක්ගහක් සහ අගලක කොටසකින් යුත් ඉඩම | එම .. | 0 0 6·9 |
| 3 | නාගහවත්ත .. | පොල්ගහක්ද, පුවක්ගහක්ද, පුවක්ගහක්ද, දෙඩම්ගහක්ද, ජම්බෝලගහක් සහ කොස් පැලයකින් යුත් පොල් ඉඩම | හේවහෙට්ටිගෙයි ජොහානා සිල්වා, උඩහමුල්ල | 0 0 1·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ ජූලි මස 17වෙනි දින පෙරවරු 10යේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒකොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මැයි මස 21වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඩබ්ලිව්. එච්. මුර්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කුඩාවැලේ රේල්වේ ස්ටේෂන්පලට යෑමට පාරක් ඉදිකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම් නම්:—

මුල් සිතියමේ නො. A 148. ගම—ගල්අමුන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හොරකඳඇලකුඹුර .. | කුඹුර .. | වලහපිටියේ අරත්ගමගේ සියදෑ නයිදේ .. | 0 0 18 |
| 2 | — .. | වෙල්ඇල .. | එම .. .. | 0 0 1·2 |
| 3 | හොරකඳඇලකුඹුර .. | කුඹුර .. | එම .. .. | 0 0 25 |
| | | | | 0 1 4·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ ජූනි මස 23වෙනි දින පෙරවරු 9යේ කනිසමට මාරවිල තානායම්පලේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මැයි මස 15වෙනි දින පුත්තලමේ කච්චේරියේදීය.

ඒ. ඊ. ක්‍රිස්ටෝපල්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධව වර්ෂ 1912යේ අඩංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

1934–35 රා රේන්ද විකිණීම.

වර්ෂ 1934ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් 1935ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දක්වා ඇති දොළොස් මාසය තුළ පහත සඳහන් මණ්ඩිවල රා බෙදා විකිණීම සම්බන්ධ සීල්කරන ලද "ටැන්ඩර්" නම් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1934ක්වූ මැයි මස 4වෙනි දින ප්‍රසිද්ධකරණලද නොම්මර 8,046 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීම සම්බන්ධ කොන්දේසිවලට යටත්වූ සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1934ක්වූ ජූනි මස 29වෙනි සිකුරාදා පෙරවරු 11 වනතුරු කදුරුගලවත්තේ තැබෑරුම සම්බන්ධවද, පෙරවරු 11.30 වනතුරු උලිදුවාවේ තැබෑරුම සම්බන්ධවද, රත්නපුරේ කච්චේරියේදී භාරගනු ලැබේ.

2\. එක එක රා තැබෑරුමට වෙන වෙනම ටැන්ඩර් පත්‍ර එවිය යුතුයි. එක තැබෑරුමකට එක ඉල්ලුම්පත්‍රයකට වඩා දැම්මට කිසිවෙකුට අවසර නැත.

3\. ඉල්ලුම්පත්‍ර එවන අයම 1934ක්වූ ජූනි මස 29වෙනි දින වන සිකුරාදා පෙරවරු 11ට සහ 11.30ට පෙනී නොසිටියොත් යම් ටැන්ඩර්පත්‍රයක් කල්පනාකරනු නොලැබේ.

4. යම් ටැන්ඩර් පත්‍රයක් හෝ සියලු ටැන්ඩර්පත්‍රම භාර නොගෙන අත්හැරීමට හෝ යම් තැබෑරුමකට සෑහෙන අන්දමේ ටැන්ඩරයක් ලැබී නැත්නම් එය එවලේම ප්‍රසිධ වෙන්දේසියේ විකිණීමේද බලය ඒජන්ත උන්නාන්සේ වෙත තබාගෙන තිබේ.

5. ඉල්ලුම්පත්‍ර භාරගනුලැබූ අයට බලයදෙනුලැබූ බව ප්‍රකාශකල වහාම, විකිණීමේ කොන්දේසි අත්සන්කර ඇප බැදිමක් වශයෙන් දෙමාසයක රේන්ද මුදලට සමාන මුදල් ගණනක් ආණ්ඩුවේ ඒජන්තතුමාට ගෙවන්ට ඕනෑය.

රා රේන්ද විකිණීමේ කොන්දේසිවලින් යම් එකක් කඩ කිරීම ගැණ එකී මුදල සම්පූර්ණයෙන් හෝ එයින් කොටසක් රාජසන්තක කරනු ලැබීමට මේ මුදල් යටත්ය. එකී රාජසන් තකකිරීම කොන්දේසි කඩකිරීම ගැණ වෙනයම් දඬුවමක් ඇත්නම් ඊට වැඩිමනත් වශයෙන්ය. එකී ඇප බැදිම බලය දෙනුලැබූ අය විසින් අසිතිවාසිකම විකුණන දවස් 14 ඇතුළ තදී T 23 දරණ ඇක්සයිස් පෝර්මයේ ප්‍රකාර ඔප්පුවක් පිට කළ යුතුයි.

6. වැඩිදුර කාරණ රත්නපුරේ කච්චේරියෙන් ඉල්ලුම්කළ විට ලබාගත හැකිය.

ඇන්. ජේ. ලඩිංටන්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙනුව.

වර්‍ෂ 1934ක්වූ මැයි මස 22වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

**හැඩුල්පත්‍රය—රත්නපුර දිස්ත්‍රික්කේ.**

1. නවදුන්කෝරළේ කදුරුගලවත්ත යන ගමේ.
2. කොලොන්නාකෝරළේ උලිපුවාව යන ගමේ.

---

## 1920සේ නොම්මර 11 දරණ ප්‍රදේශික ආණ්ඩු ව්‍යවස්ථාව.

කළුතර නාගරික ප්‍රදේශ සභාවේ නො. 7වෙනි කොට්ඨාසයට සාමාජිකයෙක් තෝරාගැනීම පිණිස වර්‍ෂ 1934ක්වූ ජූනි මස 30වෙනි සෙනසුරාදා රැස්වීමක් පැවැත්වීමට අදහස්කරගෙන තිබේ.

සාමාජිකයෙක්වීමට ඉල්ලුම්කරණ අයගේ නම ලියවිල්ල කින් යෝජනාකළ යුතුයි. එම යෝජනා පත්‍රය ඉහත කියන ලද කොට්ඨාසයේ කැමැත්ත දෙන්නන්ගේ නාම ලැයිස්තුවේ පෙනෙන අයගෙන් අඩු ගණනේ දෙදෙනෙක් විසින් අත්සන් කළ යුතුවන්නේර මෙම පත්‍ර භාරගැනීමට නියමකර තිබෙන වර්‍ෂ 1934ක්වූ ජූනි මස 30වෙනි සෙනසුරාදා පූර්වභාග 11ට හෝ ඊට ප්‍රථම කළුතර නාගරික ප්‍රදේශ සභා කන්තෝරුවට භාර දිය යුතුයි.

ඉහතකී කොට්ඨාසයට එක ඉල්ලුම්කරුවෙකුට වැඩි ගණනක් යෝජනාකරණු ලැබේනම්, සාමාජිකවරුන් තේරීමක් වර්‍ෂ 1934ක්වූ ජූලි මස 14වෙනි සෙනසුරාදා මෙහි පහත සඳහන් කරණ ස්ථානයෙහිදී පවත්වනු ලැබේ.

කැමැත්ත ගැනීමට උදේ 9ට පටන්ගෙන සවස 3ට නිමාර කරණුලැබේ.

ඡන්දය දෙන ස්ථානය : උතුරු කළුතර, " වැඹිල් රෝඩ් " පාරේ, දියමන්ති ජුබිලි පිරිමි පාඨශාලාව.

ජේ. ලයිම්,
කළුතර උප ඒජන්ත වෙනුව.

වර්‍ෂ 1934ක්වූ මැයි මස 19වෙනි දින
කළුතර කච්චේරියේදීය.

---

## අන්‍ය දැන්වීම.

**1907 අවුරුද්දේ 1වෙනි රෙගුලාසියෙ 8වෙනි වගන්තියෙ 1වෙනි පෙළේ B. අකුරය ධරන වගන්තිය පිට දැන්වීමයි.**

මෙහි පහත අත්සන්කරන මඩකලපුවෙ ආරපත්තුවෙ පදිංචි පරමකුට්ටියර් අයියන් පුල්ලෙ වන මා මඩකලපු දිස්ත්‍රික් කයේ කාරුත්කොට්ටසිවූ නොහොත් අක්‍රපත්තුවේ දෙමළ භාෂාවෙන් වැඩකරන නොතාරිස්කෙනෙක්ව පත්කරනලෙස අද සිට තුන්මාසයක් පසුවූ තැන ලංකාවේ රෙජිස්ට්‍රාර් ජෙනරාල්තුමා වෙත අයදුම්පතක් යැවීමට අදහස් කරන බව මෙයින් මහජනයාවෙත දන්වමි.

P. Aiyampillai.

ආරපත්තු, මඩකලපුව, අප්‍රේල් 1934.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.